# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2044/1 – 2017 නොවැම්බර් 06 වැනි සඳුදා – 2017.11.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතලේ උඩසියපත්තුව සුළු කොට්ඨාසයේ, ඉඹුල්පිටිය ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක එම්ජ්/යුකේඩබ්ලිව්/2010/65 හා 2010.04.30 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 5.6869 ක් පමණ වන ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – හුන්නස්ගිරිය වත්ත – ප්‍රමාණය: හෙක්. 0.8424**
උතුරට: බුලත්වත්ත ඔය; නැගෙනහිරට: ප්‍රාදේශීය සභා මාර්ගය; දකුණට: ප්‍රාදේශීය සභා මාර්ගය සහ ආර්. එම්. එස්. කුමාර හිමිකම් කියන හුන්නස්ගිරිය වත්ත; බටහිරට: ආර්. එම්. එස්. කුමාර හිමිකම් කියන හුන්නස්ගිරිය වත්ත, මාර්ග (මා.සං.අ.) සහ බුලත්වත්ත ඔය.

02. **කැබලි අක්ෂර 'බී' – හුන්නස්ගිරිය වත්ත – ප්‍රමාණය: හෙක්. 4.8445**
උතුරට: ප්‍රාදේශීය සභා මාර්ගය සහ බුලත්වත්ත ඔය; නැගෙනහිරට: මාර්ගය; දකුණට: මාර්ගය, රාජ්‍ය වැවිලි සංස්ථාව හිමිකම් කියන හුන්නස්ගිරිය වත්ත සහ ඇළ; බටහිරට: ඇළ සහ ප්‍රාදේශීය සභා මාර්ගය.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2009/එෆ්ආර්/239.
2017 සැප්තැම්බර් මස 25 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 – 867